**මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) II අදියර -2016**

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය ) අදියර II හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය (ජා.ස.ජ.නි) සහ ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) අතර 2001 පෙබරවාරි 20 දින එළඹි ගිවිසුම යටතේ පිටත වටරවුම් මහාමාර්ගයේ සිට කොළඹ නගරයට විස්තරාත්මක සැලසුම් අධ්‍යයනයක් සඳහා ලද රු. මිලියන 417 කට සමාන ජපන් යෙන් මිලියන 580 ක ප්‍රදානයකින් මෙම ව්‍යාපෘතිය ඇරඹිණි. තවද මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ අදියර II යටතේ කඩුවෙල සිට කඩවත දක්වා මහාමාර්ග කිලෝමීටර් 8.9 ක් ඉදිකිරීමට ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිත ආයතනය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සමඟ එස්එල්-පී 91 හා එස්එල්-පී 101 දරණ ණය ගිවිසුම් වලට පිළිවෙලින් 2008 ජුලි 29 වන දින සහ 2011 මාර්තු 22 දින එළඹී තිබුණි.

## 1.2 <u>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය</u>

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ (පිටත වටරවුම් මහාමාර්ග ව්‍යාපෘතිය) අදියර II හි ණය ගිවිසුම අනුව, එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොළඹ නාගරික ප්‍රදේශයේ වාහන තදබදය අවම කිරීමට හැකි වන පරිදි දක්ෂිණ අධිවේගය හා කොළඹ නගරයේ සිට විහිදෙන අනෙකුත් ජාතික මාර්ග සමග සම්බන්ධ වන කොළඹට මායිම්ව අධිවේගී මාර්ගයක් ඉදිකිරීම හා එමගින් රටේ අනෙකුත් ප්‍රදේශ සමග සම්බන්ධතාවය පුළුල් කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ණය ගිවිසුම අනුව, අදියර II ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 55,482 කට සමාන ජපාන යෙන් මිලියන 44,097 ක් වූ අතර ඉන් රු.මිලියන 46,759 කට සමාන ජපාන යෙන් මිලියන 37,406 ක් ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපාන නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකග වී තිබුණි. අදියර II යටතේ ඉදිකිරීම් 2008 මැයි මාසයේදී ආරම්භ කිරීමට නියමිත වූ අතර 2012 අප්‍රේල් වන විට මාස 48 ක් ඇතුළත අවසන් කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත් අදියර II යටතේ මහාමාර්ග කොටස ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව 2009 ඔක්තෝබර් 22 දින කොන්ත්‍රාත්කරුවෙකුට පිරිනමා තිබුණු අතර අදාල ඉදිකිරීම් වැඩ 2015 ජුලි 18 දින නිම කර තිබුණි.කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

## 1.3 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 <u>විගණකගේ වගකීම</u>

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය

ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ ඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමණාකරනය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් හා ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ,ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 <u>තත්ත්වාගණන විගණන මතය සඳහා පදනම</u>

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරිම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්.

#### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු.

පහත සඳහන් ගණකාධිකරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට දේශිය හා විදේශිය උපදේශකයින්ට ගෙවිය යුතු රු. මිලියන 8.30 ක් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කොට නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය වෙනුවෙන් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව ගෙවූ එකතුව රු. මිලියන 80.26 ක බැදීම් හා පොළී ගාස්තු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.2 නොසැසඳු ශේෂ.

2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කළ මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු. 971,574 ක පොදු කාර්ය පිරිවැය ගාස්තු ඊට අනුරූපීව මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කළ රු.164,274 ක ලැබිය යුතු ශේෂ සමඟ එකඟ වී නොතිබුණි. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු වෙනත් ශේෂයන් එකතු රු.මිලියන 2.07 ක් පෙන්නුම් කළද මාර්ග සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන වල එවැනි ලැබීම් ශේෂ කිසිවක් පෙන්නුම් කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

ව්‍යාපෘතිය විසින් රු.මිලියන 304.96 ක ප්‍රසම්පාදනය කොට ව්‍යාපෘති කාල සීමාව අවසානයේදී ආයතනය විවිධ ආයතන වලට පැවරූ වත්කම් එනම් ලී බඩු හා කාර්යාල උපකරණ වලට අදාලව වාර්තා ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන නොයෑම නිසා භෞතිකව සත්‍යාපනය කළ නොහැකි විණි.

**2.2.4 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.**

කොන්තාත්තු ගිවිසුම් වගන්තිය 102.1 හා 2003 පෙබරවාරි 27 දිනැති මාර්ග සංවර්ධන අධිකාරියේ චක්‍රලේඛ අංක 250 ට අනුව ව්‍යාපෘතිය කොන්ත්‍රකරුවන් හරහා ප්‍රසම්පාදනය කළ මෝටර් වාහන කොන්ත්‍රාත් කාලය අවසානයේදී මාර්ග සංවර්ධන අධිකාරියට භාර දීය යුතුය. කෙසේවෙතත් කොන්තාත්කරුවන් හරහා ප්‍රසම්පාදනය කළ රු. මිලියන 186.98 ක මෝටර් වාහන වෙනත් ව්‍යාපෘතියකට භාර දී තිබුණි. එසේ වුවත් එම වත්කම් වල අයිතිය 2016 සැප්තැම්බර් 05 දින මාරු කර තිබුණද ව්‍යාපෘතියේ වත්කමක් ලෙස එම මෝටර් වාහනවල වටිනාකම අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළදී හා 2016 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් වල මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන් කිරීම | අරමුදල් උපයෝජනය 2016 වර්ෂය තුළ | | අරමුදල් උපයෝජනය 2016 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන | ජපන් යෙන් මිලියන | රු. මිලියන |
| ජා.ස.ජ.නි | | | | | | | |
| ණය අංක-91 | 5,718 | 5,445 | 1,410 | 1,092.47 | 1,382.08 | 36,323.97 | 45,953.46 |
| ණය අංක-101 | 31,688 | 41,314 | - | | | | |
| ශ්‍රී.ලං.ර | 6,691 | 8,723 | 50 | 32.06 | 40.56 | 1,077.41 | 1,363.03 |
| එකතුව | 44,097 | 55,482 | 1,460 | 1,124.53 | 1,422.64 | 37,401.38 | 47,316.49 |

**3.2 භෞතික ප්‍රගතිය**

කඩුවෙල සිට කඩවත දක්වා වූ කි.මී. 8.9ක් දිග පිටත වටරවුම් මහාමාර්ගයේ අදියර II ඉදිකිරීම් වැඩ, ඉඩම් අත්පත් කර ගැනීම් හා අනෙකුත් පරිපාලන වියදම් හැර රු.බිලියන 44.88 කට නිමකිරීමට අපේක්ෂිතවී තිබුණි. කෙසේවෙතත්, 2016 දෙසැම්බර් 31 දිනට රු.බිලියන 47.37 ක වටිනා ඉදිකිරීම් වැඩ සහතික කර තිබුණි. 2015 ජුලි 18 දින අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් වැඩ නිමකර මාර්ග සංවර්ධන අධිකාරියට භාර දී තිබූ අතර 2015 සැප්තැම්බර් 17 දින මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා විවෘත කර තිබුණි. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 වන දිනට රු.බිලියන 47.37 ක් වටිනා ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇති සහතික කළ බිල්පත් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට 2017 සැප්තැම්බර් 30 දිනටත් ලැබී නොතිබුණි.

**3.3 ඉඩම් අත්පත්කර ගැනීමේ හා කටයුතු ප්‍රතිස්ථාපන කටයුතු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට රජයේ ඉඩම් ඇතුලුව ඉඩම් කැබලි 1221 ක් අත්පත් කර ගැනීමට අපේක්ෂිතව තිබුණු අතර රජයේ ඉඩම් ඇතුලුව ඉඩම් කැබලි 1205 ක් අත්පත් කර ගෙන තිබුණි. තවද 2016 දෙසැම්බර් 31 දිනට එකතු රුපියල් මිලියන 1,790.70 ක් වන්දි වශයෙන් ගෙවා තිබුණි. ඉඩම් අත්පත් කර ගැනිමේ කටයුතු වලට සම්බන්ධ නිලධාරින්ට දිරි දීමනා ලෙස රු. 912,574 ක් ගෙවා තිබුණද, වන්දි ගෙවීම් ප්‍රමාදවීම් වලට අදාල පොළී ගෙවීම සඳහා රුපියල් මිලියන 290.05 ක් වැය කර තිබු බව නිරීක්ෂණය විය.

(ආ) බියගම රුක්අත්තනගහවත්තේ ඉඩමේ අවතැන් වූ පවුල් නැවත පදිංචි කිරිමේ කටයුතු සඳහා ව්‍යාපෘතිය රු.මිලියන 22.83 ක් වැය කර තිබුණි. 2017 ජුලි 11 විගණකයන් කළ ක්ෂේත්‍ර පරික්ෂාවේදී හානියට පත් පුද්ගලයින්ගෙන් ඉල්ලුමක් නොමැතිවීමෙන් ඉඩම් කැබලි 10ක් නිෂ්ක්‍රීයව තිබුණි. තවද ගංවතුර හානි වැලැක්වීම සඳහා ආරක්ෂක තාප්පයක් (gabion wall) ඉදි කිරිම හේතුවෙන් ඉඩම් කැබලි 07 නැවත පදිංචි කිරීම් කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි විය.